# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

**අංක 11,839—1959 අගෝස්තු 25 වැනි අඟහරුවාදා—25.8.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

අ.අ.කා. අංකය : C. 218/56 (IV)

වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් ගරු ආර්. ජී. සේනානායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළදී, 1946යේ හා 1947 ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 49(3) වැනි වගන්තිය යටතේ, අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ගරු සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා, 1959 අගෝස්තු 22 වැනි දින සිට, වාණිජ හා වෙළඳ ඇමති වශයෙන්, ස්වකීය රාජකාරිවලට අතිරේකව වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් පත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණපරිදී,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
ආග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 අගෝස්තු 24 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලය.

---

### 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

#### අංක 131 දරණ නියෝගය

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (i) වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති තැන්පත් සොලමන් වෙස්ට් රිජ්වේ ඩයස් බණ්ඩාරනායක වන මම, ලංකාවේ එක තැනක සිට ලංකාවේ තවත් තැන්වලට ආහාර පාලක විසින් හෝ ප්‍රථමයෙන් සඳහන් කළ තැන ඇතුළත් ප්‍රදේශයෙහි නියෝජ්‍ය ආහාර පාලක විසින් හෝ සහකාර ආහාර පාලක විසින් හෝ මේ ඉහතකී අය වෙනුවෙන් නිකුත් කළ බලපත්‍රයක් පිට හෝ නොහොත් එකී බලපත්‍රයක අන්තර්ගත කොන්දේසි පිට හැර උම්බලකඩ (සියළුම වර්ග) කිසියම් ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම හෝ ඉවත් කිරීම මෙම නියෝගයෙන් තහනම් කරමි.

එහෙත් මෙම නියෝගයේ ඉහත දැක්වෙන තහනම, පහත සඳහන් ක්‍රියාවන්ට බලපවත්වන්නේ නැත :—

(අ) ලංකා රජය වෙනුවෙන් කිසිවෙකු උම්බලකඩ කිසියම් ප්‍රමාණයක් ප්‍රවාහණය කිරීම හෝ ඉවත් කිරීම ;

(ආ) ආහාර පාලක විසින් නියම කොට ඇති ක්‍රමය යටතේ තමාට අයත් නිත්‍යානුකූල සලාකය වශයෙන් ලබාගත් උම්බලකඩ ප්‍රමාණය එසේ ලබාගත් ස්ථානයේ සිට පාරිභෝගිකයාගේ වාසස්ථානයට කිසිවෙකු විසින් ප්‍රවාහණය කිරීම හෝ ඉවත් කිරීම ;

(ඇ) නියෝජ්‍ය ආහාර පාලක විසින් හෝ ඔහු වෙනුවෙන් නිකුත් කරන ලද කූපිතාන්සියක හෝ බලපත්‍රයක නැතහොත් තොග වෙළෙන්දෙකු විසින් නිකුත් කරන ලද කූපිතාන්සියක සඳහන් උම්බලකඩ ප්‍රමාණයක් එම කූපිතාන්සිය හෝ බලපත්‍රය දරණ කිසිවෙකු විසින්, එම උම්බලකඩ ප්‍රමාණය ලබාගත් ස්ථානයේ සිට යථෝක්ත කූපිතාන්සියේ හෝ බලපත්‍රයේ සඳහන් තොග වෙළෙන්දාගේ, සමුපකාර ගබඩාවේ හෝ බලය ලත් වෙළෙන්දාගේ ගබඩාවට හෝ ව්‍යාපාරික ස්ථානයට ප්‍රවාහණය කිරීම හෝ ඉවත් කිරීම.

ඉහත "(අ)" යටතේ සඳහන් "තොග වෙළෙන්දා" යනුවෙන් හැඟවෙන්නේ සමුපකාර තොග වෙළඳ ආයතනය හෝ 1949 අංක 21 දරණ පනතින් සංශෝධිත 1936 අංක 16 දරණ සමුපකාර සමිති ආඥා පනතේ 6වෙනි වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර ගබඩා සංගම් හෝ සමුපකාර ගබඩාවලට, සමුපකාර වෙළඳ සැල්වලට හා බලය ලත් වෙළඳුන්ට කිසියම් පාලන ද්‍රව්‍යයක් බෙදා හැරීම සඳහා 1952 ආහාර පාලන රෙගුලාසිවල "ඊ" ශීර්ෂයේ III වෙනි කොටසේ 5 වෙනි රෙගුලාසිය යටතේ නියෝජ්‍ය හෝ සහකාර ආහාර පාලක විසින් බලය දෙනු ලැබූ වෙනත් කිසි සුදුසු පුද්ගලයෙකු වේ.

ඉහත "(ඈ)" යටතේ සඳහන් "බලය ලත් වෙළෙන්දා" යනුවෙන් හැඟවෙන්නේ කිසියම් පාලන ද්‍රව්‍යයක්, නියමිත ප්‍රදේශවලට, ආයතනවලට හෝ ජනතා කොටස්වලට බෙදා හරින්නෙකු ලෙස, 1952 ආහාර පාලන රෙගුලාසිවල "ඊ" ශීර්ෂයේ III වෙනි කොටසේ 5 වෙනි රෙගුලාසිය යටතේ නියෝජ්‍ය හෝ සහකාර ආහාර පාලක විසින් බලය දෙනු ලැබූ වෙළෙන්දෙකු හෝ වෙනත් නිසි සුදුසු පුද්ගලයෙකු වේ.

ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති.

1959 අගෝස්තු මස 25 දින,
කොළඹදීය.

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උප ලේඛනයේ සඳහන් නියෝග මවිසින් පිළිගනු ලැබූ බව 1950හේ අංක 29 දරණ මිළ පාලන පණතේ 4 වැනි වගන්තියේ 7 වැනි අතුරු වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි :—

ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1959.8.25 දින,
කොළඹ දීය.

### උපලේඛනය

| නියෝගයේ දිනය | | නියෝගය දුන් බලධාරියා | | නියෝගය බලපවත්වන ද්‍රව්‍ය | | නියෝග පල කළ ගැසට් පත්‍රය |
|---|---|---|---|---|---|---|
| 59.3.23 | ... | යාපනය දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | ... | ශුද්ධ නොකළ දුඹුරු පාට සීනි | ... | 59.3.28 දින අංක 11,711 |
| 59.3.23 | ... | එම | ... | ශුද්ධ කළ සුදු සීනි | ... | 59.3.28 දින අංක 11,711 |
| 59.5.15 | ... | මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක | ... | සීනි ... | ... | 59.5.25 දින අංක 11,749 |
| 59.5.19 | ... | හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක | ... | සීනි ... | ... | 59.5.29 දින අංක 11,753 |
| 59.5.19 | ... | එම | ... | සීනි ... | ... | 59.5.29 දින අංක 11,753 |
| 59.6.24 | ... | එම | ... | සහල් ... | ... | 59.7. 1 දින අංක 11,795 |
| 59.5.25 | ... | පුත්තලම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... | සහල් සහ වී | ... | 59.5.29 දින අංක 11,753 |
| 59.6. 1 | ... | රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | ... | සහල් ... | ... | 59.6. 5 දින අංක 11,764 |
| 59.6.22 | ... | එම | ... | සහල් ... | ... | 59.6.26 දින අංක 11,790 |
| 59.6.13 | ... | කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | ... | සහල් ... | ... | 59.6.15 දින අංක 11,775 |
| 59.6.12 | ... | කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... | සහල් ... | ... | 59.6.17 දින අංක 11,777 |
| 59.6.12 | ... | එම ... | ... | සහල් ... | ... | 59.6.17 දින අංක 11,777 |
| 59.6.18 | ... | ගාල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | ... | සහල් ... | ... | 59.6.24 දින අංක 11,782 |
| 59.6.15 | ... | නුවරඑළිය දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... | සහල් ... | ... | 59.6.24 දින අංක 11,782 |
| 59.6.18 | ... | කෑගල්ල දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | ... | සහල් සහ වී | ... | 59.6.26 දින අංක 11,790 |
| 59.6.22 | ... | මාතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | ... | සහල් ... | ... | 59.6.26 දින අංක 11,790 |
| 59.6.14 | ... | කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | ... | සහල් ... | ... | 59.6.29 දින අංක 11,792 |
| 59.6.16 | ... | වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක ... | ... | සහල් ... | ... | 59.7. 3 දින අංක 11,797 |
| 59.6.16 | ... | එම | ... | බෙග්මි (බුරියානි) සහල් | ... | 59.7. 3 දින අංක 11,797 |
| 59.6.15 | ... | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක | ... | සහල් ... | ... | 59.7.6 දින අංක 11,800 |

---

# මිළ පාලන දැන්වීම්

**ෂක්.ඊ.53 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය** — **එළුමස් සහ හරක්මස්**

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කෑගල්ල දිස්ත්‍රික්කයේ උප (ආහාර) මිළ පාලක තැන්පත් නාගමුත්තු පුලේන්දිරන් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව—

(1) අංක 11,643 සහ 1959 ජනවාරි 21 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද අංක කේ.ඊ.47 සහ 1959 ජනවාරි 16 වැනි දින දරණ ආහාර මිළ නියෝගය අද සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 2 සිට 5 දක්වා ඇති තීරවල සඳහන් මිළ එළුමස් හෝ මෙරට හරක්මස් රාත්තලක වැඩිම මිළ වශයෙන් මෙම නියෝගයෙන් නියම කරමි. එම තීරයන්හි මුදුනේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් එම උප ලේඛනයේම 1 වැනි තීරයේ සඳහන් කොට ඇති ප්‍රදේශ තුළ එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතු බවද මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාය්‍යී සඳහා—

(අ) '' එළුමස් '' යනුවෙන් හැඟවෙන්නේ බැටළුවකුගේ හෝ එළුවකුගේ මාංශයි. බොකු, බඩවැල් ආදී සියලු ආකාර ඉවත් කරනු ලබන දය මීට ඇතුළත් නොවේ ;

(ආ) '' මෙරට හරක්මස් '' යනුවෙන් හැඟවෙන්නේ ඇති කරන ඉන්දියානු හෝ සිංහල ගවයන්ගේ හෝ මීහරකුන්ගේ මාංසයයි. බොකු, බඩවැල් ආදී සියලු ආකාර ඉවත්කරනු ලබන දය මීට ඇතුළත් නොවේ ;

(4) කටු සහිත එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන කල්හි විකුණන මුළු බරින් සියයට විසි පහකට වඩා කටුවල බර වැඩි නොවිය යුතුයි ;

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කොට ඇති සෑම ප්‍රදේශයකම කිසියම් තැනක හෝ වාහනයක තමාට අයිතිව හෝ තමාගේ පාලනය යටතේ උපලේඛනයෙහි සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් ඇති සෑම වෙළෙන්දකුම එම ප්‍රදේශය සඳහා උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් සම්බන්ධයෙන් මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන ලෙස තැබිය යුතුයි.

(6) ඉවත් කරනු ලබන දය සමඟ එළුමස් හෝ මෙරට හරක්මස් එකම ගනුදෙනුවකදී විකුණනු ලබන විට එළුමස් හෝ මෙරට හරක්මස් ඉවත් කරනු ලබන දයින් වෙන් වශයෙන් කිරා විකිණිය යුතුයි ;

(7) සෑම වෙළෙන්දෙකුම එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන කල්හි එළුමස් හෝ මෙරට හරක්මස් ලබාගන්නාට සැබෑ බර පහසුවෙන් බලාගැනීමට හැකිවනසේ බර කිරන තරාදිය හෝ තරාදි තැබිය යුතුයි ;

(8) මීට යාකර ඇති උපලේඛනයේ සඳහන් වර්ගවලට සහ ශ්‍රෙණිවලට අයත් එළුමස් හෝ මෙරට හරක්මස් විකුණන සෑම වෙළෙන්දෙකුම එළුමස් හෝ මෙරට හරක්මස් ලබාගන්නකු ඉල්ලා සිටිය විට කුවිතාන්සියක් දිය යුතුයි. එම කුවිතාන්සියේ—

(අ) විකුණූ දිනය,

(ආ) විකුණූ එළුමස් හෝ මෙරට හරක්මස් ප්‍රමාණය (බර),

(ඇ) විකුණූ එළුමස් හෝ මෙරට හරක්මස් වල විස්තරය, සහ

(ඈ) විකුණූ මස් ප්‍රමාණයට ගෙවූ මුදලද,

සඳහන් විය යුතුයි ;

(9) මෙම නියෝගයෙන් වැඩීම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළ කිසිවකු උපලේඛනයේ සඳහන් දය වෙන කිසියම් මසක් හෝ මංශයක් සමග කලවම්කොට නොවිකිණිය යුතුයි ;

(10) උපලේඛනයේ සඳහන් දය විකුණන කල්හි, එකී දය ඔතා හෝ බහා දෙන කිසියම් ද්‍රව්‍යයක මිළක් වෙතොත් එය එම උපලේඛනයේ 2 සිට 5 වැනි තීරයන්හි සඳහන් වැඩීම මිළෙහි අන්තර්ගත වේ ;

(11) මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් හැඟවෙන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

නාගමුත්තු සුලේන්දිරන්,
කෑගලු දිසාවේ උප (ආහාර) මිළ පාලකතැන.

වර්ෂ 1959යේ අගෝස්තු මස 21 වැනි දින, පෙරවරු 10ට කෑගල්ලේදී අත්සන් කරන ලදී.

උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනිතීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය | 5 වැනි තීරය |
|---|---|---|---|---|
| ප්‍රදේශය | එළුමස් (කටුරහිත) රාත්තලක වැඩීම මිළ | එළුමස් (කටු සහිත) රාත්තලක වැඩීම මිළ | මෙරට හරක්මස් (කටු රහිත) රාත්තලක වැඩීම මිළ | මෙරට හරක්මස් (කටු සහිත) රාත්තලක වැඩීම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| පරණකුරු කෝරලේ බෙලිගල් කෝරලේ ගල්බඩ සහ කිණිගොඩ දෙකෝරලේ ... ... ... | 2 0 | 1 75 | 0 70 | 0 60 |
| අටුළුගම සහ පනාවල් දෙකෝරලේ, දෙහිගම්පල් කෝරලේ සහ පාත බුලත්ගම ... ... ... | 2 0 | 1 75 | 0 80 | 0 70 |

සැළකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.